# සංක්ෂිප්තය


අ.පො.ස (සා.පෙ.) විද්‍යාව හා තා.වේ. විෂයමාලාවේ තෝරාගත් විෂයය සංකල්ප කිහිපයක් ආශ්‍රිත අත්දැකීම් කෙරෙහි සිසුන් දක්වන රුචිකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදුකිරීම මෙම නිබන්ධනයට මාතෘකාව වේ.

ප්‍රධාන අරමුණු 04 ක් ඔස්සේ මෙම අධ්‍යයනය සිදුකරන ලදී. එනම්, අ.පො.ස (සා.පෙ.) විද්‍යාව හා තා.වේ. විෂයමාලාව තුළින් එකී විෂයයට අදාළ විෂයය සංකල්ප කිහිපයක් ආශ්‍රිත ඉගෙනුම් සිද්ධි කිහිපයක් හඳුනාගැනීම, ඒවා අතුරෙන් තෝරාගත් සංකල්ප 09 ක් ආශ්‍රිත අත්දැකීම් කෙරෙහි සිසුන්ගේ රුචිකත්වය විමසීම, රුචිකත්වයේ පැවතිය හැකි විවිධත්වයට බලපාන සාධක හඳුනාගැනීම, රුචිකත්වය අඩු සංකල්ප කෙරෙහි රුචිකත්වය වැඩි කිරීම සඳහා අදාළ විෂයය සංකල්ප සාධනයට යෝග්‍ය ප්‍රවේශයන් යෝජනා කිරීම ආදියයි. විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ යන ක්‍රම මගින් පර්යේෂිකාව දත්ත රැස්කරන ලදී.

මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස අධ්‍යාපන කලාපයේ 1AB, 1C, 2 යන එක් වර්ගයකින් පාසල් දෙක බැගින් පාසල් 06 ක සිසුන් 120 ක් නියැදිය ලෙස යොදාගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා සඳහා අදාළ පාසල් නියෝජනය වන සේ ගුරුවරුන් 06 දෙනෙකුද යොදා ගන්නා ලදී.

රැස්කර ගත් දත්ත, ප්‍රතිශත, වගු, ප්‍රස්තාර ආකාරයට ඉදිරිපත් කර විශ්ලේෂණය කරන ලදී.

10 වන ශ්‍රේණියේ සිසුන් ඇතැම් සංකල්ප ආශ්‍රිත ඉගෙනුම් සිද්ධි සඳහා වැඩි රුචිකත්වයක් ද, ඇතැම් ඉගෙනුම් සිද්ධි සඳහා අඩු රුචිකත්වයක්ද දැක්වීමට හේතු ලෙස අනාවරණය වූ කරුණු කිහිපයක් වේ.

ඒවා අතර, විෂයමාලාව ආශ්‍රිතව පැනනැඟුණු ගැටළු, විෂයය උගන්වන ගුරුවරුන් හේතුවෙන් උද්ගත වී ඇති ගැටළු, විෂයය ඉගෙනගන්නා සිසුන් වෙතින් හටගත් ගැටළු, විද්‍යාගාර පහසුකම් හා ප්‍රායෝගික ක්‍රියාකරකම්වල යෙදීම පිළිබඳ පැනනැඟී ඇති ගැටළු යනාදිය පෙන්වා දී ඇත.

මෙම ගැටළු සඳහා විසඳුම් ලෙස ඉදිරිපත් කරන ලද යෝජනා පහත සඳහන් වේ. විෂයමාලාවේ පවතින දුර්වලතා සම්පූර්ණ කිරීම, ගුරුවරුන් වෙතින් පැනනැඟී ඇති ගැටළු අවම කිරීමට පියවර ගැනීම, සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය හා සබැඳුනු ගැටළු සොයා බලා ඒවාට පිළියම් යෙදීම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ගුරුවරුන්ගේද, සිසුන්ගේද නැඹුරුතාව වැඩිදියුණු කිරීම ආදිය ප්‍රධාන වශයෙන් දැක්විය හැකිය.